# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1781/23 - 2012 ඔක්තෝබර් මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2012.10.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය යටතේ නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

උතුරු මැද පළාතේ පළාත් සභාවට තේරී පත්වීම හේතු කොටගෙන නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය යටතේ, සභාපති වන කේ. පී. එස්. කුමාරසිරි නම් වූ සභාපති අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා දිසානායක මුදියන්සේලාගේ නලින් දිසානායක මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී කරුණාසිංහ ජයරත්නගේ සම්පත් මාධව වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, දිසානායක මුදියන්සේලාගේ නලින් දිසානායක මහතා නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

කේ. ජේ. එස්. මාධව,
තේරීම්භාර නිලධාරී,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2012 ඔක්තෝබර් මස 18 වැනි දින,
අනුරාධපුර,
මැතිවරණ කාර්යාලයේ දී ය,

11 - 459

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

උතුරු මැද පළාතේ පළාත් සභාවට තේරී පත්වීම හේතු කොටගෙන ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

පුංචි බණ්ඩාගේ රංජිත් කුමාර නම් වූ සභිකයා අයත්වන දේශප්‍රේමී ජාතික පෙරමුණ නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ , ඒ පක්ෂයට අයත් ඒ ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු වන ජයලත් මුදියන්සේලාගේ අබේවික්‍රම ජයලත් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි කරුණාසිංහ ජයරත්නගේ සම්පත් මාධව වන මම, (262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ජයලත් මුදියන්සේලාගේ අබේවික්‍රම ජයලත් මහතා ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

කේ. ජේ. එස්. මාධව,
තේරීම්භාර නිලධාරි,
ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය සභාව.

2012 ඔක්තෝබර් මස 19 වැනි දින,
අනුරාධපුර,
මැතිවරණ කාර්යාලයේ දී ය,

11 - 460

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.